# ඕස්ට්‍රේලියානු සංක්‍රමණ ප්‍රතිපත්තිය පිළිබඳ ආචාර්ය (ph.D) උපාධියක්
# උබයසිරි විජයනන්ද වික්‍රම ට



''ඕස්ට්‍රේලියානු සංක්‍රමණ නීති ප්‍රතිපත්ති හා ශ්‍රී ලාංකික සංක්‍රමණිකයෝ'' (The Australian Immigration Law policy and the Sri Lanka Migrants) යන තේමාව යටතේ උබයසිරි විජයනන්ද වික්‍රම විද්වතාණන් විසින් වසර කිහිපයක් තුළ ඕස්ට්‍රේලියාවේ විශ්වවිද්‍යාලයන් කිහිපයක කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස නිව් සවුත් වේල්ස් හි, නිව් ඉංග්ලන්ඩ් විශ්වවිද්‍යාලය ඔහු වෙත නොබෝදා ආචාර්ය උපාධියක් පිරිනැමුවාය..

ඕස්ට්‍රේලියානු රජයේ ශිෂ්‍යත්වයක් ලැබ, අර්ධ කාලීනව බාහිර පර්යේෂණ ශිෂ්‍යයකු ලෙස අධ්‍යයන කටයුතුවල නිරත වුණ වික්‍රම මහතා, ඕස්ට්‍රේලියාව යටත් විජිත කිහිපයකට බෙදී තිබී 1788 සිට 1900 දක්වා කාලපරිච්ඡේදය තුළ, ක්‍රමයෙන් වෙන් වෙන්ම වර්ධනය වූ සංක්‍රමණ නීති පද්ධතියත්, විශේෂයෙන්ම 19--01 දී ඕස්ට්‍රේලියාව ස්වාධීන පෙඩරල් රාජ්‍යයක් බවට පත්වීමෙන් පසුව නව පාර්ලිමේන්තුව මගින් ප්‍රථමයෙන් සම්මත කරන ලද ''1901 සංක්‍රමණිකයන් සීමා කිරීමේ පනත'' සිට මේ දක්වා වූ ක්‍රමික ප්‍රතිපත්තිමය විකාශනයත් ඔහු සිය විචාරාක්ෂියට ලක් කොට ඇත.

සුදු ඕස්ට්‍රේලියා ප්‍රතිපත්තිය (white Australia Policy) ක්‍රියාත්මක වූ 1901 සිට 1973 දක්වා වූ වකවානුවේදී, එය ජනවාර්ගික සම්භවයකින් යුත් ඕස්ට්‍රේලියානුවනට බලපෑ අයුරුද, විශේෂයෙන් ශ්‍රී ලාංකික සම්භවයකින් යුත් සිංහල ජනවාර්ගික ප්‍රජාවට බලපෑ සංක්‍රමණික නීති සිද්ධාන්තයන් හා ඕස්ට්‍රේලියාවේ පදිංචි සිංහල ජනවර්ගයේ වර්ධනය හා එයට බලපෑ සාමාජික, සංස්කෘතික හා ආගමික පදනම ඔහුගේ ගවේෂණයේ විශේෂ සාමාජික, සංස්කෘතික හා ආගමික පදනම ඔහුගේ ගවේෂණයේ විශේෂ සැළකිල්ලට භාජනය කොට තිබේ.

ඕස්ට්‍රේලියානු සංක්‍රමණ නීති පද්ධතිය හා ප්‍රතිපත්ති සමුදාය, සමකාලීන චින්තන න්‍යායයන්ට අනුරූපව, ජනවාර්ගික දෘෂ්ටියෙන් නිම කරන ලද, සාරගර්භ පර්යේෂණ ග්‍රන්ථයක් ලෙස, විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ විශේෂ ගෞරවයට, මෙම කෘතිය පාත්‍ර වී ඇත.

ඉංග්‍රීසි හා සිංහල විෂයයන් හදාරා ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (බී.ඒ.) උපාධියද, පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධියද, එංගලන්තයේ බර්මිංහැම් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි ව්‍යවහාරික වාග් විද්‍යාව පිළිබඳව විද්‍යාපති (එම්.එස්.සී.) උපාධියද දරණ මොහු ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අධිනීතිඥ පාඨමාලාව හදාරා, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥයකු ලෙසද දිවුරුම් දී තිබේ.

සාහිත්‍යය විචාරකයක--, ගත් කතුවරයකු, කවියකු හා ප්‍රවීණ කථිකාචාර්යවරයකු ලෙස ශ්‍රී ලංකාවේ පතල කීර්තියක් දැරූ වික්‍රම මහතා, ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ භාෂා අධ්‍යයන අංශයේ ප්‍රධානියා ලෙස 1970 සිට 1986 දක්වා සේවය කොට ඇත.

1986 දී නිපුණ සංක්‍රමණිකයකු ලෙස ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරට පැමිණි වික්‍රම මහතා එවක පටන් මේ දක්වා, නිව් සවුත්වේල්ස් හි ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයකු ලෙස සේවය කරයි. තවද ඕස්ට්‍රේලියාවේ විශේෂ ගුවන් විදුලි සේවයේ සිංහල අංශය භාර ප්‍රධානියා ලෙස 1992 සිට 2000 මාර්තු දක්වා කරන ලද ප්‍රජා සේවාව කාගේත් පැසසුමට හේතුවිය.

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් හි සිංහල සංස්කෘතික හමුව 1990 දී ආරම්භ කිරීමට පුරෝගාමී වූ අය අතර ප්‍රමුඛයකු වූ මොහු එහි ව්‍යවස්ථා මාලා සම්පාදනය කොට, සංස්ථාපිත සංවිධානයක් බවට පත් කළේය. තවද උතුරු පැරමැටා ප්‍රාථමික පාසල පුද්ගලික වගකීම යටතේ, ගිවිසුමක් මගින් රජයෙන් ලබාගෙන, ස්වෙච්ඡාවෙන් ප්‍රථම සිංහල පාසල ආරම්භ කරන ලද්දේද වික්‍රම මහතාගේ පුරෝගාමීත්වයෙනි.

2005 වසරේ දී ඕස්ට්‍රේලියාවේ විශේෂ ගුවන් විදුලි සේවයේ සිංහල සංග්‍රහය ඉදිරිපත් කිරීම සඳහා යමින් සිටියදී මාරක රිය අනතුරකට ගොදුරු වූ වික්‍රම මහතා, යන්තමින් දිවි ගලවා ගෙන කලක් ශල්‍ය කර්ම මැද රෝගාතුරව සිටියේය.

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

VIC MOTOR CARE CENTRE
Mechanical Repairs
194 Glenroy Road
Glenroy 3046
Tel : 9306 8677
All Mechanical Repairs
RWC
Major/Minor Services
Tune ups
Brake & Clutch
Head & Engine
ඔබේ වාහනයේ
සියළුම අලුත්වැඩියාවන් සඳහා
විශ්වාසවන්ත තැන
All Work Guaranteed
LP Gas Conversions
අහස උසට යන පෙට්‍රල් මිලෙන් ගැලවෙන්න
අදම
නවීන තාක්ෂණයට අනුව
ඔබේ වාහනය ගෑස් වලට හරවා
රජයෙන් ලැබෙන ඩොලර් 2000
දීමනාව ලබාගන්න
වගකීම් සහිත සේවාව
Factory12
50 Camp Road
Broadmeadows 3047
Tel : 9359 5060
Jagath - Sannasa



Wasantha Wanasinghage
Vic Motor Care Centre